www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ශ්‍රී ලංකාවේ සුනාමි රළ පහරට ගොදුරුවූවෝ ලෝසවෙ අඩවියට කතා කරති

# “එකම දේශපාලකයෙකු වත් අප බැලීමට පැමිනියේ නැත”

***Sri Lankan tsunami victims speak to the WSWS***

**"Not one politician has visited us"**

**අපේ වාර්තාකරුවන් විසිනි**

**2004 දෙසැම්බර් 29**

ශ්‍රී ලංකාවේ දකුනු, නැගෙනහිර හා උතුරු මුහුදු බඩ ප්‍රදේශවල වැඩි වැඩියෙන් මල සිරුරු සොයා ගනු ලබන අතරතුර පසුගිය ඉරිදා සිදු වූ සුනාමි ගැලීමෙන් ඇති වූ මරන සංඛ්‍යාව 25,000 දක්වා නැගිය හැකි බව බලධාරීහු අඟහරුවාදා පිලිගත්හ. අනාථ කඳවුරු අවතැන්වූ සිය දහස් ගනන් ජනයාගෙන් පිරී ඉතිරී යද්දී පාවනය වැනි වසංගත වේගයෙන් පැතිර යා හැකි බවට ද ඔවුහු අනතුරු ඇඟවූහ.

නවතම වාර්තාවන්ට අනුව දිවයිනේ යුද්ධයෙන් විනාශ වූ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ මරන සංඛ්‍යාව 8,000කට වැඩි ප්‍රමානයක් දක්වා නැග ඇති අතර 500,000ක් ජනයා අවතැන්ව සිටිති. සමාජ සුභසාධන ඇමැතිනී සුමේධා ජයසේනගෙන් උපුටා දැක් වූ රොයිටර් වාර්තාවක් සඳහන් කලේ ‘‘මල සිරුරු වෙරල දිගේ සේදෙමින් පවතී. මුදාගැනීමේ නිරතවන්නන් වෙතින් අප වෙත ලැබෙන වාර්තා පෙන්නුම් කරන්නේ 25,000ක් මිය ගොස් ඇති බවයි. කුමක් කල යුතු දැයි අපි දන්නේ නැහැ.’’ නමුත් බොහොමයක් ජනයා ආන්ඩුවේ ඇස්තමේන්තු විශ්වාස කරන්නේ නැත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවි* වාර්තාකරුවෝ ව්‍යසනයේ ගොදුරු බවට පත්වූවන් සමග කතා කිරීම සඳහා රට පුරා පිහිටි විපතට පත් ප්‍රදේශවලට ගමන් කරමින් සිටිති. දැනටමත් අපට හමුවූ පිරිස් තමන්ගේ පෙලීම් සම්බන්ධයෙන් ආන්ඩුවේ නොසලකා හැරීම පිලිබඳව තමන් දුටු දෙය ගැන කෝපය හා සැලකිලිමත්බව විදහා දක්වමින් තම අසීරු තත්වය පිලිබඳව සාකච්ඡා කිරීමට උනන්දු වූහ.

මාතර දකුනේ දරුනු ලෙස බලපෑමට ලක්වූ ප්‍රදේශවලින් එකකි. මාර්ගයෙන් අර්ධයක් පමනක් හෙලි පෙහෙලි කර ඇති නිසා තවමත් මුහුදු බඩ ප්‍රධාන මාර්ගය ඔස්සේ එහි ලඟාවිය නොහැක. අගනුවර වන කොලඹින් කිලෝමීටර් 160ක් දකුනට පිහිටි ප්‍රදේශය පුරා වෙරල දිගේ උදම් රල මගින් ඇති කල විනාශය යමකුට දැක ගත හැක. මාතර ප්‍රදේශයේ තත්වය වඩාත් දරුනු ය.

මාතර ගමනේදී සිදු වූයේ කුමක් දැයි ජනයා අපට පැවසූහ. මාතරින් කිලෝමීටර් 45ක් පමන දුරින් ගාල්ලේ සිදුවූ විශේෂයෙන් ම ඛේදජනක සිද්ධියක් පිලිබඳව ඔවුහු කතා කරති. ලමා වාට්ටුව හා ගැබිනි මව්වරුන්ගේ වාට්ටුව ද ඇතුලත්ව මහමෝදර රෝහලින් බාගයක් පමන ගසා ගෙන යනු ලැබින. ජීවිත ඉතිරි වූයේ ටික දෙනෙකුගේ පමනි.

අවතැන් වූ ජනයාගෙන් පිරි කඳවුරු කීපයක් මාතර ඇත. රාහුල විද්‍යාල කඳවුරේ 3,000ක් පමන දෙනා රැස් වී සිටිති. ආන්ඩුවේ ඇමතිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හෝ අනෙකුත් බලධාරීහු කිසිවෙක් මේ වන තෙක් ඔවුන් බැලීමට ගොස් නැත. අප එහි ලඟා වූ විට තමන්ගේ විස්තර කීමට ජනයා රැස් වන්නට විය.

‘‘උදේ 10.30ට විතර විශාල රල ධාරාවකට අප හසු විය. අපට පැයකට පමන කලින් ත්‍රිකුනාමලේ ජනතාව එවැනිම තත්වයකට මුහුන පෑ බව මට දැනගන්නට ලැබුනා. ඒ අවස්ථාවේ බලධාරීහු අපට අනතුරු ඇඟවූයේ නැත්තේ ඇයි? ’’ මෙසේ අසන්නේ මාතර තොටමුන පදිංචිකරුවකු වන 73 හැවිරිදි පුංචිහේවා යි. එම ගම්මානයේ 250ක් පමන දෙනා මිය ගොස් ඇත. පුංචිහේවාගේ වැඩිමහල් සොහොයුරිය හා ඇගේ සැමියා මිය ගියහ.’’ අපට හැම දෙයක් ම නැති වුනා. මේ ප්‍රදේශයේ ජනතාව තමන්ගේ ආදරනීයයන්ව පොලිතීන්වල ඔතා සමූහ මිනී වලවල්වල මිහිදන් කලා.

‘‘මෙහි අපට අති මූලික දේ පවා ලබා දී නැත. අපට ආන්ඩුවෙන් කිසිවක් ලැබී නැත. මෙහි කුඩා ලමුන් ද සිටිති. ඔවුන්ගේ තත්වය අනතුරුදායක යි.’’

24 හැවිරිදි නේරංජනා සරෝජිනී ප්‍රකාශ කලේ ‘‘මෙතරම් විද්‍යාත්මකව සංවර්ධනය වූ ලෝකයක මෙවන් විපතකට මුහුන දීමට සිදුවීම පිලිබඳව අප කම්පා වෙනවා. මෙහි සිටින බොහෝ පවුල්වල එක් අයෙක් හෝ දෙදෙනෙක් නැතිවෙලා. අපගේ ප්‍රදේශයේ ලෑලිවලින් තනා තිබූ ගෙවල් 20න් 19ක් ම මුහුද විසින් විනාශ කරනු ලැබුවා.

‘‘අප කීයක් හරි සොයා ගත්තේ සපත්තු හදන්නන් හැටියට ස්වයං රැකියාවක යෙදිල යි. අපට අපගේ සියලු යන්ත්‍ර සූත්‍ර නැතිවුනා. අප කුමක් කරන්න ද? ’’

අනෙකුත් අය මුහුදට ඇදගනු ලැබීම මෙම ජනයා

දැක ගත්හ. ඔවුන්ව බේරා ගැනීමට ගිය සමහර අයට ද එම ඉරනමට ම මුහුන දීමට සිදු විය. ඉතිරිව සිටින අයට ප්‍රතිකාර කිරීම සඳහා ඇත්තේ වෛද්‍යවරු දෙදෙනෙක් පමනි. පැදුරු පවා නොමැතිව ඔවුන්ට පත්තර කඩදාසි එලා පොලවේ නිදාගැනීමට බලකෙරී ඇත. වැසිකිලි ඇත්තේ 6ක් පමනි. ආහාර හා අනෙකුත් අවශ්‍යතා සම්පාදනය කරන්නේ ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන අය යි.

''මගේ ජීවිත කාලය තුල මට අත්දකින්නට ලැබී ඇති වඩාත්ම දරුනු තත්වය මෙයයි. සැම දෙනාට ම තමන්ගේ ම කතාවක් කීමට ඇත.'' යි හරිස්චන්ද්‍ර විස්තර කරයි. ඔහුට සෘජු බලපෑමක් වී නැති නමුත් අන් අයට උදව් කිරීම සඳහා ඉදිරිපත්ව ඇත. ''මෙය සිදු වූයේ පල්ලි යන දවසකයි. ඉරිදා පොලට සහභාගි වීම සඳහා ජනයා පැමිනියා. එදා පෝය දිනයක් වූ නිසා අනෙකුත් අය පන්සල් ගියා. දහස් ගනනක් අනතුරට ලක් වී ඇත.

''සිදුවීමට නියමිතව තිබුනු ව්‍යසනය පිලිබඳව අනතුරු ඇඟවීමට ආන්ඩුවට නොහැකි වූයේ ඇයි? යල් පිනූ විද්‍යාත්මක සංවර්ධනයක් සමග වැඩ කිරීම පිලිබඳව ඔවුන් කතා කරනවා. ඔවුන් තර්ක කරන්නේ පරන උපකරන සමග රට ගොඩනැගිය යුතු බව යි. මෙය ප්‍රභූ තන්ත්‍රය තමන්ගේ ලාභ ගැන පමනක් තකන සාමාන්‍ය ජනයා ගැන නොසිතන පද්ධතියකි. ඔවුන් ඔබගේ අවශ්‍යතා ආරක්ෂා කරාවි යයි ඔබ බලාපොරොත්තු තබනවා ද?

''දින කීපයකට පෙර ජනාධිපතිනී චන්ද්‍රිකා කුමරතුංගගේ පාලනයට අවුරුදු 10ක් පිරීම සැමරීම සඳහා ඔවුහු රුපියල් දස මිලියන ගනන් වියදම් කරමින් සිටියහ. ප්‍රධානතම උත්සවය පැවැත්වූයේ මේ මාතර යි. නමුත් මේ ව්‍යසනයෙන් විපතට පත් ජනතාවට අවශ්‍ය දෑ ලබා දීම සඳහා මුදල් සොයා ගැනීමට ඔවුන්ට නොහැක.''යි හරිශ්චන්ද්‍ර කෝපයෙන් පැවසී ය.

නැගෙනහිර හා දකුනේ තරම් නොවූවත් කොලඹ දිස්ත්‍රික්කයේ බටහිර පිහිටි මොරටුවේ ද මුහුදු බඩ ප්‍රදේශය සම්පූර්නයෙන් බලපෑමට ලක්ව ඇත.

පලමු රල්ල උදේ 10.05ට පැමිනි අතර දෙවැන්න පැමිනුනේ උදේ 11.00ට යි. ගාලු මහා මාර්ගය දක්වා - මීටර 80ක් 90ක් දුරින් පිහිටි - සමස්ත ප්‍රදේශයම බලපෑමට ලක්ව ඇත. ලීයෙන් තැනූ කුඩා නිවාස සිය ගනනක් විනාශ වී ඇත. ගඩොලින් තැනූ නිවාස ඇත්තේ කිහිපයක් පමනි. එහි ජීවත්වන ජනයා ධීවරයන් හෝ කුඩා පලතුරු හා එලවලු වෙලෙන්දන් ය.

මුහුදු තරංග පැමිනෙන විට පදිංචිකරුවෝ තම නිවාස අත්හැර ආරක්ෂිත ප්‍රදේශ කරා දිව ගියහ. මේ ප්‍රදේශයෙන් වාර්තා වන්නේ ඉතා සුලු මරන සංඛ්‍යාවක් වන අතර බොහෝ දෙනා තුවාල ලබා ඇත. ගාලු පාරෙන් අනෙක් පැත්තේ සිටින වඩා පහසු ජීවිත ගතකරන ජනයා ද පලා ගියහ. වාහන ඇති අය ඒවායින් යාමට උත්සාහ කල ද මාර්ගය අවහිර වී තිබූ අතර සාමාන්‍ය ව්‍යාකුල බවක් විය. තමන්ගේ නිවාස විනාශ වුනු ගැබිනි මව්වරු උදව් පතා දිව ගියහ. සමහර අය කුඩා දරුවන් ද සමග හිස් ලු ලු අත දිව ගියහ. ත්‍රී රෝද රථ මගින් පස් හය දෙනකු රැගෙන යමින් තිබිනි. සැම තැනක ම ව්‍යාකුල බව තිබිනි.

මොරටු වැල්ල ප්‍රදේශයේ තරුනයන් දෙදෙනෙක් අපට ප්‍රකාශ කලේ මිනිසුන් දිවගිය ද තිදෙනෙක් මිය ගිය බවයි. එක් කාන්තාවක් විදුලි සැර වැදී මිය ගියා ය.

දරුවන් තිදෙනෙකුගේ තරුන මවක් හා පලතුරු වෙලෙන්දියක් වන මාලා සිදුවූ දෙය මෙසේ විස්තර කරයි.

''දුවන්න දුවන්න මුහුදු වතුර උඩ නගිනවා යයි මගේ සමහර ඥාතීන් කැගසනු මට ඇසෙන විට මම පලතුරු විකුනමින් සිටියා. මම මගේ පලතුරු බැගය වීසි කොට දරුවන් සොයා දිව ගියා. වාසනාවට ඒගොල්ලන්ට මොකුත් වෙලා තිබුනේ නෑ. අපි හරිම දුප්පත්. අපට යන්නට තැනක් නැහැ. අපි පාරේ සිටින විට මුහුදු රල පැමින අපගේ නිවාස විනාශ කරනවා දුටුවා. අපි දෙවියන්ට කීවා. එකොලහට පමන ගාලු පාර ආසන්නයට ම තවත් රල්ලක් පැමිනියා.

''මගේ මාමන්ඩි බොහොම වයස යි. මගේ ස්වාමිපුරුෂයා හා අනෙක් අය ඔහුව පන්සලට ගෙන ආවා. එයාට එහේ ජීවත්වෙන්න අමාරුයි. මගේ නැන්දම්මා හැඬූ කඳුලෙන්. ඇය ගෘහ සේවිකාවක්. අනෙකුත් අයගේ උදව් ඇතිව ඇය මෑතක දී නිවසට විදුලි බලය ලබා ගත්තා. ඇයට කුඩා ටීවී එකක් තිබුනා. නමුත් ඒ සියල්ල විනාශ වුනා. මගේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන මට කනගාටුයි. ඒගොල්ලන්ගෙ පොත් සියල්ලම හානිවෙලා. අපට අනාගතයක් නෑ. අපට කවදා වත් කිසිම ආන්ඩුවකින් උදවු කරලා නෑ. මගේ පවුල නිරතුරුව ම ජීවත් වී තිබෙන්නේ බොහෝම බර වැඩ කරලා. මම මැදපෙරදිග වැඩට ගියහම මට ගෙව්වේ නෑ. ඒ නිසා මම හිස් අතින් ආපහු ආවා. ඒත් මට නය ගෙවන්න ඕනි.''

මොරටුවේ පිහිටි තවත් කුඩා ප්‍රදේශයක් වන මාදන්ගහවත්තේ සියලුම නිවාස විනාශ වී ඇත. එහි නිවාස 13ක පවුල් 65කට අයත් 300 දෙනෙක් වාසය කලහ. දරුවන් දෙදෙනෙකුගේ මව වන 25 හැවිරිදි තුෂාරි අපට කියන්නේ උදෑසන 8.30ට පමන මුහුද රලු බව ඔවුන්ට දැක ගන්නට හැකි වූ බවයි. ''නමුත් අපි ඒක එච්චර ගනන් ගත්තේ නෑ'' ඒත් 10.30ට විතර එක පාරටම රල්ල අඩි 20ක් විතර ඉහලට නැග්ගා. මිනිස්සු දිව්වා. තමන්ගේ රත්තරන් බඩු බේරා ගැනීමට ගිය 40 හැවිරිදි සෝමාවතී රල්ලට හසුවී මිය ගියා.

මේ ප්‍රදේශයේ බොහෝ දෙනා කුලී වැඩ කර ජීවත්වෙති. ඔවුන්ට දෛනිකව වැඩ ලැබෙන්නේ නැත. ඔවුන්ගේ වැටුප දිනකට රුපියල් 250ක් වේ. ධීවරයෝ හා වඩු කාර්මිකයෝ කිහිප දෙනෙක් ද එහි වෙති. ''අපිට තිබුනේ හරිම අමාරු ජීවිතයක්. නමුත් දැන් අපිට මුකුත් නෑ. අපිට ආහාර හෝ කුස්සි උපකරන

පවා නැහැ. ප්‍රධානම ගැටලුව වන්නේ අපට සෙවනක් නැති එකයි. ගැහැනු, පිරිමි අප සියලු දෙනාම පාරේ නිදාගන්නවා.'' යි පියදාස කියයි.

''මගේ දරුවන්ගේ අනාගතය කුමක් ද? කිසිම මන්ත්‍රී කෙනෙක් අපිව බලන්න ආවේ නෑ - ජේවීපී එකද ඇතුලත් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් හෝ යූඑන්පී එකෙන්. මම ආන්ඩුවට සහයෝගය දැක්වූවා. නමුත් ඒගොල්ලන්ට අපිව ඕන වෙන්නෙ ඡන්ද කාලෙට විතරයි. ආයිමත් ඡන්දයක් කාලෙට සහයෝගය ඉල්ලගන ඒගොල්ලො ආවොත් මම ගන්නෙ කොස්ස.''

සමන් හා අනෙකුත් තරුනයන් *ලෝසවෙඅ* ට කීවේ: ''අපිට ස්ථිර රකියා නැහැ. අපි මාලු අල්ලන්න ගියා. නමුත් දැන් අපේ බෝට්ටුව විනාශ වෙලා. අපට දැන් බෝට්ටුවක් තිබුනා වුනත් මුහුද රලු හින්ද මාලු අල්ලන්න යන්න බැහැ. දේශපාලකයින් අපව ගනන් ගන්නේ නැහැ. බලන්න අපි කොල්ලෝ 6දෙනෙක්, ඒත් අපි එක්කෙනෙකුට වත් රකියාවක් නැහැ.'' සමන් තව දුරටත් කියාගෙන ගියේ ''මම චෝදනා කරන්නෙ ආන්ඩුවට ඒ ගොල්ල අපිට අනතුරු ඇඟවූයේ නැහැ. ඒගොල්ල දුප්පත් මිනිස්සුන්ට කැමති නැත්තේ ඇයි?''

මොරටුවේ පිහිටි බෞද්ධ පන්සලක්වන ශුභවර්ධනාරාමයේ 600ක් පමන දෙනා නතර වී සිටිති. ගැහැනුන් හා ලමුන් ඇතුලේ සිටින අතර පිරිමි පිටතින් සිටිති. වයසක මවක් හා ගෘහ සේවිකාවක් වන ලීලා ප්‍රකාශ කරන්නේ: ''අපට ආහාර හා බෙහෙත් ලැබෙන්නේ පන්සලෙන්. නමුත් අපට හැමදාම මෙහෙම ඉන්න බැහැ. අපට ජීවත්වෙන්න තැනක් ඕන.''

පන්සලේ සිටින ජනයාට ප්‍රතිකාර කිරීම සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී සිටින වෛද්‍ය කුරේ ජනයාගේ තත්වය මෙසේ විස්තර කරයි: ''බොහෝ අයට තුවාලවෙලා. දරුනු ගනයේ ප්‍රශ්න නැහැ. ඒත් වයසක අයට හා ලමුන්ට වෛද්‍ය රකවල් අවශ්‍ය යි.''

පවුල් 37කින් පැමිනි 246 දෙනෙක් ශාන්ත පීතර පල්ලියේ නැවතී සිටිති. ඔවුහු තමන්ට සෙවනක් හා රැකියා අවශ්‍ය බව අවධාරනය කරති.

තමන් දිවි ගලවා ගැනීම සඳහා වත්තල ශාන්ත ආනා පල්ලිය වෙත දිව ආ 300ක් පමන දෙනා සිටිති. ඔවුන් පැමින ඇත්තේ කොලඹ සිට කිලෝමීටර් 10ක් පමන දුරින් පිහිටි වත්තල ලන්සියවත්ත ගමෙනි. ප්‍රදේශයේ විපතට පත් වූ දහස් ගනනක් දෙනා අතරට ඔවුහු ද අයත් වෙති. ඔවුන් අපට කිවේ, තමන් උදේ 10.30ට පමන පලමු රැල්ල අත් දුටු බවයි. ඔවුන් පූර්වයෙන් කිසිවක් දැන නොසිටි අතර ක්ෂනිකව ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය විය. පල්ලිය මගින් පවත්වාගෙන යන ගොලු බිහිරි පාසලට පැමිනෙන පිරිමි ලමුන් දෙදෙනෙක් රැල්ලට ගසාගෙන ගොස් මිය ගියහ.

මෙම ජනයා ද අතිශයින් දුප්පත් වේ. ඔවුන් තම ජීවිතය ගැට ගසා ගන්නේ විවිධ වර්ගයේ වැඩ කරමිනි. අතු සෙවිලි කල නිවාසවල ඔවුන් ජීවත්වන අතර එම නිවාස රැල්ලට ගසා ගෙන ගියේ ය.

රන්ජන්ගේ නිවස පිහිටා තිබුනේ කැලනි ගං මෝය සහ මුහුද අතර අනෙකුත් කුඩා නිවාස සමගිනි. ''මම ටීවී එකේ ක්‍රිකට් නරඹමින් සිටියෙමි. එක පාරට වතුර ගේ ඇතුලට ගලන්න පටන්ගත්තා. ජලය අප පස්සෙන් පන්නා එන අතර අපි සියලුම දෙනා දුවන්න පටන්ගත්තා'' යි ඔහු කියයි.

''මම වැඩ කරන්නේ සීදූවේ ප්ලාස්ටික් කොම්පැනියකයි. ඊයේ සිට අප නැවතී සිටින්නේ මේ පල්ලියේ. පල්ලියෙන් අපිට කෑම දෙනවා ආන්ඩුවේ බලධාරීන්ගෙන් අපිට කිසිවක් ලැබී නැහැ. ගුවන් විදුලිය හා රූපවාහිනිය විවිධ සහන වැඩසටහන් පිලිබඳව නිවේදනය කලත් අපට කිසිවක් ලැබී නැහැ.'' යි ඔහු අවඥාවෙන් ප්‍රකාශ කරයි.

''ඉරිදා හවස මම අපේ ප්‍රදේශයට ආපසු ගියා. ඉතිරි වී ඇත්තේ ගෙවල්වල කොන් කනු පමනයි. හැම තැනම ඝන මඩ තට්ටුවක් තිබෙනවා. මේ කොන්දේසි යටතේ අපට වෙන කොහේ හරි යන්න පුලුවන්නම් හොඳයි. නමුත් මේ කරුනු පිලිබඳව මට ආන්ඩුව කෙරෙහි විශ්වාසයක් නැහැ.

''නැවත වතාවක් ඔවුන් (ආන්ඩුවේ බලධාරීන්) අනතුරු ඇඟවීමක් කලේ නෑ. විද්‍යාව මෙතරම් වර්ධනය වී තිබිය දීත් සිදු වූ දෙය බලන්න. පාලකයෝ කිසිවක් දන්නේ නෑ. කිසිවක් කරන්නෙත් නෑ. පාලකයෝ දුප්පතුන් සඳහා කිසිවක් කරන්නේ නෑ. සියලු ඥානය හා අධ්‍යාපනය තිබෙන්නේ ඔවුන්ගේ අතේ. දුප්පතුන්ට අයිතිවාසිකම් තිබුනත් ඔවුන්ට හොඳට සලකන්නේ නෑ. එය හරියට ආහාර නැතිව මිනිසුන් මියයන අප්‍රිකාවේ ඉතියෝපියාව වගේ. පාලකයෝ පාලනය කරන්නේ ඔවුන්ගේ යහපත සඳහා පමනයි. මේ රටේ අපරාධ රේට්ටුව හරි ඉහලයි. පාර්ලිමේන්තුව තුල දී ඔවුන් ජනතාව ගැන තැකීමක් නැතිව බලය තිබෙන්නේ කාටද යන්න පිලිබඳව ගැටෙනවා. මේ ව්‍යසනයට ඔය සියල්ලම හේතු වුනා.''

ජනයා තවමත් තමන්ගේ ප්‍රියයන් වෙනුවෙන් ශෝකවෙමින් සිටිද්දී සාමාන්‍ය මනෝගතිය වන්නේ ඔවුන් වෙනුවෙන් යමක් ඉක්මනින් කිරීමට අවශ්‍ය බවයි. ඔවුහු කෝපයෙන් ද පාවා දෙනු ලැබුනේ යැයි හැඟීමකින් ද සිටිති. නමුත් අඟහරුවාදා රාත්‍රියේ පෞද්ගලික රූපවාහිනී නාලිකාවක් වන ස්වර්නවාහිනියේ පැවති සාකච්ඡා මන්ඩපයකදී සුභ සාධන ඇමතිනී සුමේධා ජයසේන ප්‍රකාශ කලේ සුනාමි රල පහර මගින් විපතට පත් වූවන්ගේ ප්‍රතිසංස්කරන කටයුතු නිම කිරීමට වසර දෙකක් පමන ගතවනු ඇති බවයි.

© www.wsws.org